# පිපුණු මලේ රුව



ශාකයේ පොදු නාමය : සිල්ක් කොටන් ට්‍රී, බටර් කප් ට්‍රී

ශාක කුලය : බික්සේසියේ (Bixaceae)

උද්භිද විද්‍යාත්මක නාමය :
(*Cochlospermum vitifolium*)

බහුලව ව්‍යාප්ත වී ඇති රටවල් : දකුණු ඇමරිකාව, කොස්ටාරිකාව හා මෙක්සිකෝව

සුදුසු දේශගුණය : නිවර්තන දේශගුණය

ශාකයේ ස්වභාවය : මීටර් 5 - 20 දක්වා උසකට වැඩෙන මධ්‍යම ප්‍රමාණයේ ගසකි.

සාමාන්‍ය තොරතුරු : හිරු එළිය ප්‍රියකරන ශාකයකි. මෙම ශාකය විශේෂයෙන් නිවර්තන කලාපයේ ගෙවතුවල අලංකාරය පිණිස වගාකරනු ලබයි. සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන මෙම ශාකය බාදනයට ලක්වූ පසෙහි වර්ධනය වීමට ද මැලිකමක් නොදක්වයි. බීජ මඟින් ප්‍රචාරණය වේ. ඒකාන්තරව හට ගන්නා පත්‍ර, පතනය වීමට පෙර රතු පැහැයට හැරේ. කහ පැහැති මල් පරාගනය දිවා කාලයේ කෘමීන් මඟින් සිදුවන අතර වවුලන් සහ පක්ෂීන් ද මල් වෙත ආකර්ශණය වන අවස්ථා බහුලය. මල් හට ගැනීම දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා සිදුවේ. ඵල හට ගැනීම ජනවාරි සිට මැයි දක්වා සිදුවේ. ඵලය ස්ඵෝටිකාවක් වන අතර එහි පුළුන් මඟින් රැලි වැටුණු කුඩා දුඹුරු පැහැති බීජ සුළං මඟින් ව්‍යාප්ත වේ. මෙහි දැවය කහ පැහැති, සැහැල්ලු වන අතර පොත්තේ කෙඳි ලණු විවීම පිණිස භාවිතා කරයි. සත්ත්ව ආහාර පිණිස, අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, ඖසු ලබා ගැනීම සහ අලංකාරය පිණිස වගා කරයි.

*ආචාර්ය ඒ. එම්. ඒ. එස්. අත්තනායක - නියෝජ්‍ය අධ්‍යක්ෂිකා*
*සුභාෂිණී සෙනෙවිරත්න - වැඩසටහන් සහකාර,*
*රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය*